# (ඉ) ග්‍රාමීය ණය

ග්‍රාමීය අංශය සඳහා ආයතනික ණය ප්‍රධාන වශයෙන් සපයනු ලබන්නේ ව්‍යාප්ත ණය ක්‍රමය, ග්‍රාමීය බැංකු සහ නව කෘෂිකාර්මික ණය ක්‍රමය මගිනි. මෙකී ණය ක්‍රම තුනම ග්‍රාමීය මට්ටමේදී මෙහෙයවනු ලබන්නේ සමුපකාර සමිති විලිනි. මෙසේ දෙනු ලබන ණයවලට අමතරව, වාණිජ බැංකු වලින්ද, විශේෂිත ණය ආයතනවලින්ද, නියමිත කාර්යයන් සඳහා රජයේ දෙපාර්තමේන්තු විසින් මෙහෙයවනු ලබන ණය ක්‍රම වලින් ද ග්‍රාමීය අංශය ණය ලබා ගනියි.

## (අ) ව්‍යාප්ත ණය ක්‍රමය

1967 සිට මෙම ක්‍රමයේ ප්‍රගතිය II (ඉ) 1 වැනි සංඛ්‍යා සටහනෙහි ත්‍රෛමාසිකව, සාරාංශ කොට දක්වා ඇත. 1970 අවසානයේ දී මෙම ක්‍රමය සමුපකාර සමිති 76 ක් මගින් මෙහෙයවනු ලැබූ අතර, පසුගිය වර්ෂය අවසානයේ දී එය මෙහෙයවනු ලැබුයේ සමිති 72 ක් මගිනි. මහජන බැංකුව විසින් මෙම සමිති සඳහා අනුමතකොට ඇති මුළු අයිරා සීමාවන් 1969 අවසානයේදී රුපියල් දශලක්ෂ 1.86 සිට 1970 අවසාන වනවිට රුපියල් දශලක්ෂ 1.90 දක්වා වැඩිවූ අතර, සමිති විසින් උපයෝගීකොට ගන්නා ලද මුළු මුදල රුපියල් දශලක්ෂ 1.16 සිට රුපියල් දශලක්ෂ 1.20 තෙක් වැඩිවිය. 1970 දී එක් සමුපකාර සමිතියක් ග්‍රාමීය බැංකුවක් වීම සඳහා මෙම ක්‍රමයෙන් අයින්විය.

**II (ඉ) 1 වැනි සංඛ්‍යා සටහන**

**1967—1970 ව්‍යාප්ත ණය ක්‍රමය**

**මහජන බැංකු ණය පහසුකම් ප්‍රයෝජනයට ගැනීම්**

රුපියල් වලින්

| කාර්තුව අවසානය | | ණය ක්‍රමයට අයිති සමුපකාර සංගම් ගණන | මුළු අයිරා පහසුකම් | |
|---|---|---|---|---|
| | | | මහජන බැංකුව විසින් අනුමත කල | සමිති විසින් ප්‍රයෝජනයට ගත් |
| 1967 | මාර්තු .. .. | 55 | 1,638,568 | 1,275,450 |
| | ජූනි .. .. .. | 56 | 1,651,068 | 1,279,757 |
| | සැප්තැම්බර් .. .. | 58 | 1,685,268 | 1,254,471 |
| | දෙසැම්බර් .. .. | 67 | 1,901·118 | 1,295,673 |
| 1968 | මාර්තු .. .. | 66 | 1,796,818 | 1,211,925 |
| | ජූනි .. .. .. | 67 | 1,829·818 | 1,231,479 |
| | සැප්තැම්බර් .. .. | 69 | 1,872,818 | 1,293,536 |
| | දෙසැම්බර් .. .. | 69 | 1,837,118 | 1,162,904 |
| 1969 | මාර්තු .. .. | 72 | 1,892,818 | 1,166,789 |
| | ජූනි .. .. .. | 72 | 1,914,818 | 1·224,288 |
| | සැප්තැම්බර් .. .. | 71 | 1,856,318 | 1,210,672 |
| | දෙසැම්බර් .. .. | 72 | 1,861,950 | 1,163,384 |
| 1970 | මාර්තු .. .. | 73 | 1,878,450 | 1,229,580 |
| | ජූනි .. .. | 74 | 1,903,450 | 1,207,662 |
| | සැප්තැම්බර් .. .. | 73 | 1,853,450 | 1,183,657 |
| | දෙසැම්බර් .. .. | 76 | 1,903,450 | 1,200,847 |

මූලය: ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව, මහජන බැංකුව

## (ආ) ග්‍රාමීය බැංකු

1965 සිට ග්‍රාමීය බැංකුවල තැන්පතු සහ ණය ත්‍රෛමාසිකව II (ඉ) 2 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

ග්‍රාමීය බැංකු ක්‍රමයේ සීඝ්‍ර ප්‍රසාරණයක් ඇතිවෙමින් පවත්නා අතර, සමාලෝචනයට භාජනය වන වර්‍ෂයේදී නව ග්‍රාමීය බැංකු 22 ක් ද, 1969 දී 24 ක්ද විවෘතකොට ඇත.

## II (ඉ) 2 වැනි සංඛ්‍යා සටහන

## ග්‍රාමීය බැංකුවල තැන්පතු හා ණය 1965 - 1970

ප්‍රමාණය රුපියල් වලින්

| කාර්තුව අවසානය | | බැංකු ගණන | තැන්පතු ගිණුම් | | | | | | | | | ණය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ඉතුරුම් | | | ස්ථාවර | | | එකතුව | | | | | |
| | | | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය |
| 1965 | මාර්තු .. | 6 | 1556 | 194,013 | 125 | 10 | 8,100 | 810 | 1566 | 202,113 | 129 | 572 | 489,485 | 856 |
| | ජූනි .. | 7 | 1925 | 305,250 | 159 | 7 | 3,682 | 526 | 1932 | 308,932 | 160 | 771 | 693,621 | 900 |
| | සැප්තැම්බර් .. | 8 | 2597 | 504,160 | 194 | 7 | 3,734 | 533 | 2604 | 507,894 | 195 | 1038 | 855,946 | 825 |
| | දෙසැම්බර් .. | 8 | 2924 | 491,626 | 168 | 9 | 4,734 | 526 | 2933 | 496,360 | 169 | 1153 | 914,699 | 793 |
| 1966 | මාර්තු .. | 8 | 3244 | 499,462 | 154 | 9 | 8,732 | 970 | 3253 | 508,195 | 156 | 1316 | 1010,628 | 768 |
| | ජූනි .. | 8 | 3519 | 525,370 | 149 | 13 | 20,586 | 1583 | 3532 | 545,956 | 155 | 1433 | 1072,293 | 748 |
| | සැප්තැම්බර් .. | 11 | 3923 | 604,505 | 154 | 11 | 19,868 | 1806 | 3924 | 624,373 | 159 | 1611 | 1204,125 | 747 |
| | දෙසැම්බර් .. | 13 | 4636 | 703,011 | 152 | 15 | 22,737 | 1516 | 4651 | 725,748 | 156 | 1783 | 1326,457 | 744 |
| 1967 | මාර්තු .. | 14 | 5150 | 707,475 | 137 | 16 | 21,587 | 1349 | 5166 | 729,062 | 141 | 2037 | 1413,639 | 694 |
| | ජූනි .. | 16 | 5971 | 821,448 | 138 | 20 | 38,952 | 1948 | 5991 | 860,400 | 144 | 2173 | 1560,560 | 718 |
| | සැප්තැම්බර් .. | 20 | 6968 | 1038,201 | 149 | 28 | 40,242 | 1437 | 6996 | 1078,433 | 154 | 2529 | 1815,637 | 718 |
| | දෙසැම්බර් .. | 27 | 8792 | 1305,846 | 118 | 41 | 65,381 | 1595 | 8833 | 1371,227 | 155 | 2897 | 2029,476 | 701 |
| 1968 | මාර්තු .. | 30 | 10378 | 1650,228 | 159 | 85 | 111,430 | 1310 | 10463 | 1761,658 | 168 | 3336 | 2366,359 | 709 |
| | ජූනි .. | 34 | 12137 | 2063,947 | 170 | 137 | 161,486 | 1179 | 12274 | 2225,433 | 181 | 4128 | 2592,847 | 628 |
| | සැප්තැම්බර් .. | 39 | 14689 | 2643,592 | 180 | 254 | 221,270 | 871 | 14943 | 2864,862 | 192 | 4713 | 3105,393 | 659 |
| | දෙසැම්බර් .. | 44 | 17359 | 3110,576 | 179 | 287 | 222,614 | 776 | 17646 | 3333,190 | 189 | 5586 | 3630,731 | 650 |
| 1969 | මාර්තු .. | 54 | 19763 | 3624,967 | 183 | 621 | 267,109 | 430 | 20384 | 3892,072 | 191 | 6109 | 4161,873 | 681 |
| | ජූනි .. | 57 | 22314 | 4406,770 | 197 | 575 | 383,550 | 667 | 22889 | 4790,320 | 209 | 6770 | 4397,882 | 669 |
| | සැප්තැම්බර් .. | 64 | 25598 | 4930,514 | 193 | 687 | 437,884 | 637 | 26285 | 5368,398 | 204 | 7379 | 4969,245 | 673 |
| | දෙසැම්බර් .. | 68 | 28626 | 5712,893 | 199 | 724 | 460,168 | 636 | 29350 | 6173,061 | 210 | 7893 | 5572,281 | 706 |
| 1970 | මාර්තු .. | 80 | 31663 | 6209,882 | 196 | 420 | 521,345 | 1241 | 32083 | 6731,227 | 209 | 8506 | 6049,587 | 711 |
| | ජූනි .. | 86 | 34887 | 7104,222 | 176 | 841 | 697,101 | 829 | 35728 | 7801,323 | 212 | 8894 | 6265,170 | 705 |
| | සැප්තැම්බර් .. | 89 | 38417 | 8255,943 | 215 | 932 | 721,352 | 774 | 39349 | 8977,295 | 220 | 9671 | 6779,046 | 701 |
| | දෙසැම්බර් .. | 90 | 49939 | 16109,287 | 322 | 892 | 799,117 | 896 | 50831 | 16908,405 | 333 | 10017 | 7122,213 | 711 |

මූලය:— ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව.
මහජන බැංකුව.

## ග්‍රාමීය බැංකුවල තැන්පතු හා ණය

| දිස්ත්‍රික්කය | ග්‍රාමීය බැංකු ගණන | තැන්පතු ගිණුම් | | | | | | එක |
|---|---|---|---|---|---|---|---|---|
| | | ඉතුරුම් | | | ස්ථාවර | | | |
| | | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව |
| කොළඹ .. | 12 | 9256 | 3,769,786 | 407 | 43 | 90,083 | 2095 | 9299 |
| කළුතර .. | 5 | 3438 | 926,571 | 270 | 20 | 29,383 | 1469 | 3458 |
| මාතලේ .. | 1 | 555 | 196,197 | 354 | 9 | 7,471 | 830 | 564 |
| නුවරඑළිය .. | 1 | 384 | 63,657 | 166 | – | — | – | 384 |
| ගාල්ල .. | 4 | 1902 | 505,981 | 266 | 268 | 74,015 | 276 | 2170 |
| මාතර .. | 3 | 1396 | 551,402 | 395 | 8 | 13,447 | 1681 | 1404 |
| හම්බන්තොට .. | 5 | 1584 | 341,091 | 315 | 30 | 27,864 | 929 | 1614 |
| යාපනය .. | 1 | 521 | 147,359 | 283 | 61 | 192,734 | 3160 | 582 |
| මන්නාරම .. | නැත | – | – | – | – | – | – | – |
| වවුනියා .. | නැත | – | – | – | – | – | – | – |
| මඩකලපුව .. | නැත | – | – | – | – | – | – | – |
| අම්පාර .. | 4 | 905 | 166,203 | 184 | 11 | 14,050 | 1277 | 916 |
| ත්‍රිකුණාමලය .. | නැත | – | – | – | – | – | – | – |
| කුරුණෑගල .. | 12 | 7069 | 2,592,854 | 367 | 41 | 61,418 | 1498 | 7110 |
| පුත්තලම .. | 2 | 2306 | 620,999 | 269 | 3 | 12,000 | 4000 | 2309 |
| අනුරාධපුරය .. | 5 | 2256 | 430,271 | 191 | 101 | 9,719 | 96 | 2357 |
| පොළොන්නරුව .. | 8 | 3346 | 1,061,853 | 317 | 36 | 49,625 | 1378 | 3382 |
| බදුල්ල .. | 6 | 3502 | 1,109,747 | 317 | 63 | 36,722 | 583 | 3565 |
| මොනරාගල .. | 1 | 486 | 84,087 | 173 | – | – | – | 486 |
| රත්නපුරය .. | 11 | 4496 | 1,459,215 | 325 | 61 | 96,562 | 1583 | 4557 |
| කෑගල්ල .. | 4 | 2216 | 679,104 | 306 | 22 | 41,461 | 1885 | 2238 |
| මහනුවර .. | 5 | 4321 | 1,402,909 | 325 | 115 | 42,564 | 370 | 4436 |
| එකතුව .. | 90 | 49939 | 16,109,286 | 323 | 892 | 799,118 | 896 | 50,831 |

## II (ඉ) 3 වැනි සංඛ්‍යා සටහන

### පිළිබඳව දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය

(1970 දෙසැම්බර් 31 අවසන් වර්ෂය වෙනුවෙන්)

| තුව | | ණය | | | | එකතුව | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | උකස් | | අනෙකුත් | | | | |
| මුදල | සාමාන්‍යය | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | අනෙකුත් | සංඛ්‍යාව | මුදල | සාමාන්‍යය |
| 3,859,869 | 415 | 3719 | 367,740·50 | 1720 | 1,521,623·68 | 5439 | 1,889,364·18 | 347 |
| 955,954 | 276 | 641 | 52,765·50 | 736 | 502,399·30 | 1377 | 555,164·80 | 403 |
| 203,668 | 361 | 43 | 3,634·00 | 61 | 42,103·61 | 104 | 45,737·61 | 440 |
| 63 657 | 166 | 31 | 2,989·50 | 130 | 91,864·25 | 161 | 94,853·75 | 589 |
| 579,996 | 267 | 436 | 36,079·00 | 447 | 254,960·33 | 883 | 291,039·33 | 330 |
| 564,849 | 402 | 179 | 19,913·00 | 226 | 153,286·88 | 405 | 173,199·88 | 428 |
| 368,955 | 229 | 608 | 78,685·50 | 275 | 211,266·23 | 883 | 289,951 73 | 328 |
| 340,093 | 584 | 732 | 113,283·00 | 83 | 67,965·00 | 815 | 181,248·00 | 222 |
| – | – | – | – | – | – | – | – | – |
| – | – | – | – | – | – | – | – | – |
| – | – | – | – | – | – | – | – | – |
| 180,253 | 197 | 1438 | 249,487·00 | 145 | 82,769·20 | 1583 | 332,256·20 | 210 |
| – | – | – | – | – | – | – | – | – |
| 2,654,272 | 373 | 936 | 88,813·00 | 1129 | 1,137,339·94 | 2065 | 1,226,152·94 | 594 |
| 632,999 | 274 | 2749 | 254,466·00 | 780 | 542,393·04 | 3529 | 796,859·04 | 226 |
| 439,990 | 187 | 1499 | 146,957·25 | 380 | 246,760·05 | 1879 | 393,717·30 | 210 |
| 1,111,478 | 329 | 1121 | 120,603·00 | 419 | 233,299·17 | 1540 | 353,902·17 | 230 |
| 1,146,469 | 322 | 435 | 59,404·50 | 1038 | 566,870·20 | 1473 | 626,274·70 | 425 |
| 84,087 | 173 | 47 | 4,087·50 | 233 | 104,923·69 | 280 | 109,011·19 | 389 |
| 1,555,777 | 341 | 1192 | 152,281·00 | 740 | 323,110 94 | 1932 | 475,391·94 | 246 |
| 720,565 | 322 | 1472 | 129,331·50 | 502 | 264,678·57 | 1974 | 394,010·07 | 200 |
| 1,445,473 | 326 | 814 | 99,549·05 | 973 | 774,599·31 | 1787 | 874,148·36 | 489 |
| 16,908,404 | 333 | 18,092 | 1,980,069·80 | 10017 | 7,122,213·39 | 28,109 | 9,102,283·19 | 324 |

මූලය. ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව,
මහජන බැංකුව.

ග්‍රාමීය බැංකුවල මුළු ඉතුරුම් මීට පෙර නොවූ විරූ ලෙස 1970 දී රුපියල් දශලක්ෂ 10.7 ක වැඩිවීමක් වාර්තා වූ අතර, එය ප්‍රධාන වශයෙන්ම විමුල්‍යනය කිරීම නිසා සිදුවූවකි. 1969 වර්ෂයේ මුල් මාස නවයේ රුපියල් දශලක්ෂ 2.1 ක වැඩිවීම 1970 වර්ෂයේ මුල් මාස නවයේ රුපියල් දශලක්ෂ 2.8 ක වැඩිවීම සමග සැසඳේ. මුළුමනින්ම වාගේ මෙම වර්ෂයෙහි මුළු තැන්පතුවල සම්පූර්ණ වැඩිවීම, ඉතුරුම් තැන්පතුවල වැඩිවීමෙන් පිළිබිඹු විය.

ග්‍රාමීය බැංකු වෙත වූ ඉතුරුම් ගිණුම් සංඛ්‍යාව 21,313 කින්ද, ඉතුරුම් තැන්පතු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 10.4 කින්ද වැඩිවූ අතර, වර්ෂයේ මුල් මාස නවයේදී පිළිවෙලින් වැඩිවීම 9,791 ක්ද, රුපියල් දශලක්ෂ 2·5 ක්ද විය. 1970 අවසානයේදී ඉතුරුම් තැන්පතු සාමාන්‍යය රුපියල් 322 ක්වූ අතර, 1969 අවසානයේදී වූයේ රුපියල් 199 කි. එය 1970 සැප්තැම්බර් මාසය අවසානය වන විට රුපියල් 215 ක් විය.

ග්‍රාමීය බැංකු වෙතවූ ස්ථාවර තැන්පතු ගිණුම් සංඛ්‍යාව 1969 අවසානයේදී 724 ක්වූ අතර, එය 1970 අවසානය වන විට 892 දක්වාද, මුදල රුපියල් 460,168 සිට රුපියල් 799,177 දක්වාද වැඩිවීය. ස්ථාවර තැන්පත් සාමාන්‍යද රුපියල් 636 සිට රුපියල් 896 දක්වා වැඩිවිය.

ග්‍රාමීය බැංකු විසින් දෙනු ලැබූ ණයවල ප්‍රසාරණය, 1969 අවසානයේදී දෙනු ලැබූ ණය සංඛ්‍යාව 7,893 සිට 1970 අවසානය වන විට 10,017 දක්වා වැඩිවීමෙන්ද, ගෙවීමට තිබෙන ණය රුපියල් දශලක්ෂ 5.6 සිට රුපියල් දශලක්ෂ 7·1 දක්වා වැඩිවීමෙන්ද පිළිබිඹුවේ. 1969 අවසානයේදී රුපියල් 706 ක්ව පැවති ණය සාමාන්‍යය 1970 අවසානය වන විට රුපියල් 711 දක්වා වැඩිවිය.

ග්‍රාමීය බැංකුවල තැන්පතු සහ ණය පිළිබඳව දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය II (ඉ) 3 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II (ඉ) 4 වැනි සංඛ්‍යා සටහන, ග්‍රාමීය බැංකු විසින් දෙනු ලැබූ ණය කාර්යයන් අනුව, විශ්ලේෂණය කොට දක්වා ඇත.

**II (ඉ) 4 වැනි සංඛ්‍යා සටහන**
**කාර්යයන් අනුව ග්‍රාමීය බැංකු ණය**
**(සෑම වර්ෂයකම දෙසැ. 31 අවසානයට)**

| කාර්යය | ප්‍රමාණය රුපියල් වලින් | | මුළු මුදලින් සියයට ගණන | |
|---|---|---|---|---|
| | 1969 | 1970 | 1969 | 1970 |
| නිෂ්පාදනය .. | 1,355,380 | 1,676,784 | 24·3 | 23·5 |
| කෘෂිකර්මාන්ත .. | 1,138,651 | 1,389,272 | 20·4 | 19·5 |
| සත්ව පාලනය .. | 49,473 | 59,790 | 0·9 | 0·8 |
| ගෘහ කර්මාන්ත .. | 167,256 | 227,722 | 3·0 | 3·2 |
| නිවාස .. | 1,983,579 | 2,731,812 | 35·7 | 38·3 |
| ණය නිදහස්වීම .. | 1,679,704 | 2,003,923 | 30·3 | 28·1 |
| වෙළෙඳාම .. | 316,372 | 381,580 | 5·7 | 5·4 |
| පාරිභෝජනය . | 62,138 | 90,945 | 1·1 | 1·3 |
| විදුලි බලය සැපයීම .. | 12,528 | 12,690 | 0·2 | 0·2 |
| අනෙකුත් .. | 152,580 | 224,476 | 2·7 | 3·2 |
| එකතුව . | 5,562,281 | 7,122,210 | 100·0 | 100·0 |

මූලය: ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව, මහජන බැංකුව.

සෑම කාර්යයක් සඳහාම දෙනු ලැබූ ණයවල කැපී පෙනෙන වැඩිවීම් විය. නිවාස කටයුතු සඳහා ණය සංඛ්‍යාව වැඩිවීම ඉතාමත්ව පැහැදිලිව පෙනෙන අතර, එය වැඩි මුළු ණය සංඛ්‍යාවෙන් සියයට 50 කට කිට්ටුවිය. කෘෂිකාර්මික නිෂ්පාදන සහ ණවු නිදහස් කිරීම සඳහා වූ ණය සංඛ්‍යාවෙහි කැපී පෙනෙන වැඩිවීමක් පෙන්නුම් කළද, මුළුය ණය සංඛ්‍යාවෙන් ඒ සඳහා වූ කොටස පිළිවෙලින් 1969 දී සියයට 20.4 සහ 30.3 ක්ද, 1970 දී පිළිවෙලින් සියයට 19·5 සහ 28·1 ක්ද වශයෙන් අඩුවිය. අනෙක් කටයුතු සඳහා දෙනු ලැබූ ණයවල වැදගත් වෙනස්කමක් නොපෙන්විය. පුළුල් වශයෙන්, ග්‍රාමීය බැංකු විසින් ණය දීමේ රටාව බොහෝ දුරට ඉකුත් වර්ෂයේදී පැවති අයුරින්ම විය.

1970 දී ග්‍රාමීය බැංකුවල තැන්පතු උපනතිය ඒවායෙහි ණය හිලව් කිරීම්වලට වඩා මනාලෙස කැපී පෙනුනි. වර්ෂ අවසානයේදී මුළු ණයට වඩා මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 9·8 කින් වැඩි විය. නමුත් මෙය විමුලායනය කිරීම නිසා ඇතිවූ තැන්පත් ප්‍රමාණයේ අස්වාභාවික වැඩිවීම හේතුකොට ගෙන සිදුවූවකි. 1969 දෙසැම්බර් අවසාන යේදී වූ රුපියල් දශලක්ෂ 0.6 කින් ණයවලට වඩා වැඩිවූ තැන්පතු ප්‍රමාණය හා සසඳන කල 1970 සැප්තැම්බර් මස අවසානය වනවිට වැඩිවූ ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2.2 කි. බැංකු 63 ක තැන්පතු අත්තිකාරම්වලට වඩා වැඩිවූ අතර බැංකු 27 ක අත්තිකාරම් තැන්පතුවලට වඩා වැඩිවිය.

ග්‍රාමීය බැංකු, උකස් කටයුතු සම්බන්ධවත් මහජන බැංකුවේ නියෝජිතයින් වශයෙන්ද කටයුතු කරනු ලැබේ. උකස් ගනුදෙනු 14325 සිට 18092 දක්වා වැඩිවූ අතර, ණය දීමේ ප්‍රමාණය රුපියල් 1,523,584 සිට රුපියල් 1,980,070 දක්වා වැඩිවිය.

**(ඇ) නව කෘෂිකාර්මික ණය ක්‍රමය**

**(i) වගා ණය සමස්ථ තත්ත්වය**

නව කෘෂිකාර්මික ණය ක්‍රමයේ ක්‍රියාත්මක ක්ෂෙත්‍රය 1970 දී තව දුරටත් පහත වැටුණි. 1967/68 සහ 1968/69 මහ කන්නවලදී දෙන ලද ණය ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 61.4 සහ රුපියල් දශලක්ෂ 45.7 හා සසඳන කළ 1969/70 මහ කන්නය සඳහා දෙන ලද ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 39.2 කි. 1969/70 ( මහ කන්නය සඳහා ) දෙන ලද ණය ප්‍රමාණය මෙම ණය ක්‍රමය යටතේ පළමු මහ කන්නය වූ 1967/68 කන්නය සඳහා දෙන ලද ණය ප්‍රමාණයෙන් සියයට 64 ක් පමණ විය. 1968 සහ 1969 යල් කන්නයන් සඳහා දෙනු ලැබූ ණය පිළිවෙලින් රුපියල් දශලක්ෂ 11.3 සහ 9·9 ක්වූ අතර, 1970 යල් කන්නයේදී දෙනු ලැබූ ණය ප්‍රමාණය, කෙසේ හෝ තරමක් දුරට, රුපියල් දශලක්ෂ 11.5 දක්වා වැඩිවිය.

ණය ක්‍රමයෙහි ක්‍රියාත්මක ක්ෂෙත්‍රය පිරිහීමට තුඩුදුන් සැළකිය යුතු හේතුව වූයේ සිය කැමැත්තෙන් ආපසු ගෙවීමේ මට්ටම ක්‍රමයෙන් හීනවීමය. 1967/68 සහ 1968/69 මහ කන්නවල සිය කැමැත්තෙන් ආපසු ගෙවූ ප්‍රමාණය එම කන්නයන් සඳහා දෙනු ලැබූ ණය ප්‍රමාණයන්ගෙන් පිළිවෙලින් සියයට 70·0 සහ 54.5 වුවද, 1969/70 මහ කන්නයේදී එම ප්‍රමාණය සියයට 47.7 දක්වා තවදුරටත් පහත වැටුණි. 1968 යල කන්නයේදී සියයට 79.6 ක් වූ සිය කැමැත්තෙන් ආපසු ගෙවන ලද ණය ප්‍රමාණය 1969 දී 76·8 දක්වා පහළ වැටුණි. 1970 යල කන්නයේ ආපසු ගෙවීමේ තත්ත්වය තවම තීරණය කිරීමට නොහැකිවී ඇත්තේ එම කන්නය සඳහා දෙනු ලැබූ ණය ප්‍රමාණයෙන් සියයට 40.9 ක් ආපසු ගෙවීමට නියමිත කාලය නොඑළඹ ඇති බැවිනි.

මෙම ණය ක්‍රමය යටතේ උකස් කළ සහල් සලාක කූපන්වල වටිනාකම ද ගණන් ගත් විට පසුගිය වර්ෂවලදී ආපසු අයකර ගත් මුළු ණය ප්‍රමාණය සිය කැමැත්තෙන් ආපසු ගෙවූ ප්‍රමාණයට වඩා අධිකය. එහෙත් 1970 දී උකස් කළ සහල් සලාක කූපන් පොත් පැහැර හැරි ණය කරුවන්ට ආපසු දීමට රජය තීරණය කළ නිසා ආපසු අය කෙරෙන මුළු ණය ප්‍රමාණය සිය කැමැත්තෙන් ආපසු ගෙවෙන ප්‍රමාණය නොඉක්මවනු ඇත.

මෙම ණය ක්‍රමය ආරම්භ වූ ද පටන් සියළුම කන්නවලදී දෙනු ලැබූ, ආපසු අයකර ගත්, කාලය දික්කළ, අයවිය යුතු සහ පැහැර හැරි ප්‍රමාණයන් II (ඉ) 5 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**දිස්ත්‍රික්ක අනුව තත්ත්වය**

1968/69 මහ කන්නයෙන් පටන්ගත් කන්නයන් හතරෙහි දෙන ලද ණය සහ ආපසු ගෙවීම් පිළිබඳව දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණයක් II (ඉ) 6 හා.II (ඉ) 7 වැනි සංඛ්‍යා සටහන්වල දක්වා ඇත.

## II (ඉ) 5 වැනි සංඛ්‍යාසටහන

### නව කෘෂිකාර්මික ණය ක්‍රමය — වී වගාව සඳහා දෙනු ලැබූ ණය

| කන්නය / මෙහෙයවුම් කටයුතු | ප්‍රමාණය රුපියල් දශලක්ෂ වලින් | | | | | | ප්‍රයෝජනයට ගත් ප්‍රමාණයේ සියයට ගණනක් වශයෙන් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මහ 1967/68 | යල 1968 | මහ 1968/69 | යල 1969 | මහ 1969/70 | යල 1970 | මහ 1967/68 | යල 1968 | මහ 1968/69 | යල 1969 | මහ 1969/70 | යල 1970 |
| දෙන ලද ණය .. .. | 61·4 | 11·3 | 45·7 | 9·9 | 39·2 | 11·5 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 | 100·0 |
| මුළු ආපසු ගෙවීම් ඉන්: .. .. | 52·4 | 9·5 | 27·0 | 7·8 | 18·7 | 6·0 | 85·3 | 84·0 | 59·1 | 78·8 | 47·7 | 52·2 |
| සිය කැමැත්තෙන් .. .. | 43·0 | 9·0 | 24·9 | 7·6 | 18·7 | 6·0 | 70·0 | 79·6 | 54·5 | 76·8 | 47·7 | 52·2 |
| සහල් සලාක කූපන් සහ වලින් .. | 9·4 | 0·5 | 2·1 | 0 2 | 0·0 | 0·0 | 15·3 | 4·4 | 4·6 | 2·0 | 0·0 | 0·0 |
| වගා විනාශය නිසා ණය දීර්ඝ කිරීමෙන් .. | 0·4 | 0·2 | 4·9 | 0·6 | 0·5 | 0·0 | 0·7 | 1·8 | 10·7 | 6·1 | 1·3 | 0·0 |
| පැහැර නොහැරීමෙන් .. .. | 0·0 | 0·0 | 0·0 | 0·1 | 0·7 | 4·7 | 0·0 | 0·0 | 0·0 | 1·0 | 1·8 | 40·9 |
| පැහැර හැරීම .. .. | 8·6 | 1·6 | 13·8 | 1·4 | 19·3 | 0·8 | 14·0 | 14·2 | 30·2 | 14·1 | 49·2 | 6·9 |

මූලය· ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව,
මහජන බැංකුව·

## 1968/69 මහ සහ 1969 යල කන්නයේ වී වගා

ප්‍රමාණය රුපියල් දහස් ගණනින්

| දිස්ත්‍රික්කය | දෙනලද ප්‍රමාණය | | ආපසු ගෙවීම | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | මුළු ගණන | | සිය කැමැත්තෙන් | | සහල් සලාකයන් | |
| | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල |
| කොළඹ-කළුතර .. | 112 | 169 | 87 | 114 | 83 | 113 | 4 | 1 |
| මහනුවර .. | 1537 | 811 | 1432 | 769 | 1389 | 760 | 43 | 9 |
| මාතලේ .. | 803 | 22 | 663 | 22 | 539 | 22 | 124 | — |
| නුවරඑළිය .. | 374 | 102 | 288 | 63 | 285 | 63 | 3 | — |
| ගාල්ල .. | 295 | 365 | 226 | 255 | 222 | 248 | 4 | 7 |
| මාතර .. | 646 | 899 | 621 | 736 | 594 | 721 | 27 | 15 |
| හම්බන්තොට .. | 2442 | 1381 | 1904 | 791 | 1805 | 788 | 99 | 3 |
| යාපනය .. | 3045 | — | 2143 | — | 2098 | — | 45 | — |
| මන්නාරම .. | 3642 | — | 1766 | — | 1766 | — | — | — |
| වව්නියාව .. | 4079 | 24 | 1560 | 19 | 1558 | 19 | 2 | — |
| මඩකලපුව .. | 4094 | 113 | 2444 | 38 | 2021 | 38 | 423 | — |
| අම්පාර .. | 3947 | 1467 | 2149 | 1338 | 1941 | 1315 | 208 | 23 |
| ත්‍රිකුණාමලය .. | 2560 | 142 | 1678 | 80 | 1321 | 71 | 357 | 9 |
| කුරුණෑගල .. | 2368 | 453 | 1640 | 246 | 1345 | 240 | 295 | 6 |
| පුත්තලම .. | 991 | 69 | 439 | 46 | 395 | 44 | 44 | 2 |
| අනුරාධපුරය .. | 7048 | 47 | 1225 | 25 | 1177 | 25 | 48 | — |
| පොළොන්නරුව .. | 4372 | 2403 | 3862 | 2113 | 3668 | 1953 | 194 | 160 |
| බදුල්ල .. | 1209 | 367 | 1021 | 329 | 930 | 327 | 91 | 2 |
| මොණරාගල .. | 1145 | 1 | 985 | 1 | 885 | 1 | 100 | — |
| රත්නපුරය .. | 860 | 926 | 779 | 748 | 767 | 745 | 12 | 3 |
| කෑගල්ල .. | 139 | 118 | 137 | 102 | 134 | 101 | 3 | 1 |
| මුළු ගණන .. | 45708 | 9879 | 27049 | 7835 | 24923 | 7594 | 2126 | 241 |

## II (ඉ) 6 වැනි සංඛ්‍යා සටහන

### ණය පිළිබඳව දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය

| විනාශවූ වගාවන් වෙනුවෙන් දීඝ කිරීම | | පැහැර හැරීම | | දෙන ලද ප්‍රමාණයේ ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ආපසු ගෙවීම | | | | | | විනාශ වූ වගාවන් වෙනුවෙන් දීඝ කිරීම | | පැහැර හැරීම | |
| | | | | මුළු ගණන | | සිය කැමැත්තෙන් | | සහල් සලාකයෙන් | | | | | |
| මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල |
| — | 1 | 25 | 54 | 77·67 | 67·45 | 74·10 | 66·86 | 3·57 | ·59 | — | ·59 | 22·32 | 31·95 |
| — | — | 105 | 42 | 93·16 | 94·82 | 90·37 | 93·71 | 2·79 | 1·10 | — | — | 6·83 | 5·17 |
| — | — | 140 | — | 82·56 | 100·00 | 67·12 | 100·00 | 15·44 | — | — | — | 17·43 | — |
| — | — | 86 | 39 | 77·00 | 61·76 | 76·20 | 61·76 | ·80 | — | — | — | 22 99 | 38·23 |
| 2 | 46 | 67 | 65 | 76·61 | 69·86 | 75·25 | 67·94 | 1·35 | 1·91 | ·67 | 12·60 | 22·71 | 17·80 |
| 3 | 74 | 22 | 89 | 96·13 | 81·86 | 91·95 | 80·20 | 4·17 | 1·66 | ·46 | 8·23 | 3·40 | 9·89 |
| 85 | 419 | 453 | 171 | 77·96 | 57·27 | 73·91 | 57·06 | 4·05 | ·21 | 3·48 | 30·34 | 18·55 | 12·38 |
| 491 | — | 411 | — | 70·37 | — | 68·89 | — | 1·47 | — | 16·12 | — | 13·49 | — |
| 985 | — | 891 | — | 48·48 | — | 48·48 | — | — | — | 27·04 | — | 24·46 | — |
| — | — | 2519 | 5 | 38·24 | 79·16 | 38·19 | 79·16 | ·04 | — | — | — | 61·75 | 20·83 |
| 81 | — | 1569 | 75 | 59·69 | 33·62 | 49·36 | 33·62 | 10·33 | — | 1·97 | — | 38·32 | 66·37 |
| 58 | — | 1740 | 130 | 54·44 | 91·20 | 49·17 | 89·63 | 5·26 | 1·56 | 1·46 | — | 44·08 | 8·86 |
| — | — | 882 | 62 | 65·54 | 56·33 | 51·60 | 50·00 | 13·94 | 6·33 | — | — | 34·45 | 43·66 |
| 58 | 24 | 670 | 145 | 69·25 | 54·30 | 56·79 | 52·98 | 12·45 | 1·32 | 2·44 | 5·29 | 28·29 | 32·00 |
| 186 | 11 | 366 | 12 | 44·29 | 66·66 | 39·85 | 63·76 | 4·43 | 2·89 | 18·76 | 15·94 | 36·93 | 17·39 |
| 2905 | — | 2918 | 22 | 17·38 | 53·19 | 16·69 | 53·19 | ·68 | — | 41. 21 | — | 41·40 | 46·80 |
| — | — | 510 | 289 | 88·33 | 87·93 | 83·89 | 81·27 | 4·43 | 6·65 | — | — | 11·66 | 12·02 |
| — | — | 188 | 38 | 84·44 | 89·64 | 76·92 | 89·10 | 7·52 | ·54 | — | — | 15·55 | 10·35 |
| 50 | — | 110 | — | 86·02 | 100·00 | 77·29 | 100·00 | 8·73 | — | 4·36 | — | 9·60 | — |
| — | — | 81 | 178 | 90·58 | 80·77 | 89·18 | 80·45 | 1·39 | ·32 | — | — | 9·41 | 19·22 |
| — | — | 2 | 16 | 98·56 | 86·44 | 96·40 | 85·59 | 2·15 | ·84 | — | — | 1·43 | 13·55 |
| 4904 | 575 | 13755 | 1432 | 59·17 | 79·30 | 54·52 | 76·87 | 4·65 | 2·43 | 10·72 | 5·82 | 30·09 | 14·49 |

මූලය: ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව, මහජන බැංකුව.

## II (ඉ) 7 වැනි සංඛ්‍යා සටහන

## 1969/70 මහ සහ 1970 යල කන්නයේ වී වගා ණය පිළිබඳව දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය

ප්‍රමාණය රුපියල් දහස් ගණනින්

| දිස්ත්‍රික්කය | දෙන ලද ප්‍රමාණය | | ආපසු ගෙවීම් — මුළු ගණන | | ආපසු ගෙවීම් — සිය කැමැත්තෙන් | | ආපසු ගෙවීම් — සහල් සලාකයන් | | විනාශ වූ වගාවන් වෙනුවෙන් දීර්ඝ කිරීම් | | පැහැර හැරීම් | | ලැබියයුතු එහෙත් පැහැර නොහරිනලද | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල |
| කොළඹ-කළුතර | 10[illegible] | 99 | 62 | 32 | 62 | 8 | — | — | — | — | 40 | 24 | — | 4 |
| මහනුවර .. | 1047 | 451 | 895 | 87 | 894 | 28 | 1 | — | — | — | 149 | — | 3 | 36 |
| මාතලේ .. | 744 | 84 | 320 | 15 | 320 | — | — | — | — | — | 424 | — | — | 69 |
| නුවරඑළිය .. | 201 | 28 | 120 | 7 | 120 | — | — | — | — | — | 77 | — | 4 | 21 |
| ගාල්ල .. | 282 | 376 | 167 | 134 | 167 | 55 | — | — | 32 | — | 76 | 112 | 7 | 130 |
| මාතර .. | 922 | 1060 | 551 | 461 | 548 | 203 | 3 | — | 256 | — | 115 | 596 | — | 3 |
| හම්බන්තොට .. | 1128 | 1379 | 393 | 156 | 393 | 55 | — | — | 165 | — | 174 | 15 | 396 | 1208 |
| යාපනය .. | 2923 | 269 | 1766 | 225 | 1766 | 93 | — | — | — | — | 1157 | — | — | 44 |
| මන්නාරම .. | 3462 | — | 1813 | — | 1813 | — | — | — | — | — | 1649 | — | — | — |
| වව්නියාව .. | 3028 | — | 1205 | — | 1205 | — | — | — | — | — | 1822 | — | 1 | — |
| මඩකලපුව .. | 2706 | 29 | 651 | — | 651 | — | — | — | — | — | 2055 | — | — | 29 |
| අම්පාර .. | 2935 | 1399 | 1592 | 864 | 1592 | — | — | — | — | — | 1343 | 3 | — | 532 |
| ත්‍රිකුණාමලය .. | 2012 | 530 | 918 | 278 | 918 | 15 | — | — | — | — | 1094 | — | — | 252 |
| කුරුණෑගල .. | 2702 | 535 | 659 | 136 | 658 | 38 | 1 | — | 17 | — | 1946 | — | 80 | 399 |
| පුත්තලම .. | 671 | 192 | 256 | 18 | 256 | 6 | — | — | 2 | — | 372 | — | 41 | 174 |
| අනුරාධපුරය .. | 6346 | 306 | 1195 | 133 | 1195 | 84 | — | — | — | — | 5067 | 104 | 84 | 69 |
| පොළොන්නරුව | 4225 | 3335 | 3626 | 2541 | 3626 | 12 | — | — | — | — | 599 | — | — | 794 |
| බදුල්ල .. | 1485 | 598 | 1092 | 503 | 1090 | 13 | 2 | — | — | — | 369 | — | 24 | 95 |
| මොනරාගල .. | 1086 | 66 | 635 | 56 | 635 | — | — | — | 4 | — | 447 | — | — | 10 |
| රත්නපුරය .. | 1052 | 561 | 710 | 250 | 710 | 59 | — | — | — | — | 339 | — | 3 | 311 |
| කෑගල්ල .. | 136 | 179 | 124 | 71 | 124 | 45 | — | — | — | — | 12 | — | — | 108 |
| මුළු ගණන .. | 39195 | 11476 | 18750 | 5967 | 18743 | 714 | 7 | — | 476 | — | 19326 | 854 | 643 | 4655 |

දෙන ලද ප්‍රමාණයේ ප්‍රතිශතයක් වශයෙන්

| දිස්ත්‍රික්කය | ආපසු ගෙවීම් — මුළු ගණන | | ආපසු ගෙවීම් — සිය කැමැත්තෙන් | | ආපසු ගෙවීම් — සහල් සලාකයන් | | විනාශ වූ වගාවන් වෙනුවෙන් දීර්ඝ කිරීම් | | පැහැර හැරීම් | | ලැබිය යුතු, එහෙත් පැහැර නොහරින ලද | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල | මහ | යල |
| කොළඹ-කළුතර | 0·78 | 32·32 | 60·78 | 8·08 | — | — | — | — | 39·21 | 24·24 | — | 43·43 |
| මහනුවර .. | 5·48 | 19·29 | 85·38 | 6·20 | ·09 | — | — | — | 14·23 | — | ·28 | 80·70 |
| මාතලේ .. | 3·01 | 17·85 | 43·01 | — | — | — | — | — | 56·98 | — | — | 82·14 |
| නුවරඑළිය .. | 9·70 | 25·00 | 59·70 | — | — | — | — | — | 38·30 | — | 1·99 | 75·00 |
| ගාල්ල .. | 9·21 | 35·63 | 59·21 | 14·62 | — | — | 11·34 | — | 26·95 | 29·78 | 2·48 | 34·57 |
| මාතර .. | 9·76 | 43·49 | 59·43 | 19·15 | ·32 | — | 27·76 | — | 12·47 | 56·22 | — | ·28 |
| හම්බන්තොට .. | 4·84 | 11·31 | 34·84 | 3·98 | — | — | 14·62 | — | 15·42 | 1·08 | 35·10 | 87·59 |
| යාපනය .. | 0·41 | 83·64 | 60·41 | 34·57 | — | — | — | — | 39·58 | — | — | 16·35 |
| මන්නාරම .. | 2·36 | — | 52·36 | — | — | — | — | — | 47·63 | — | — | — |
| වව්නියාව .. | 9·79 | — | 39·79 | — | — | — | — | — | 60·17 | — | ·03 | — |
| මඩකලපුව .. | 4·05 | — | 24·05 | — | — | — | — | — | 75·94 | — | — | 100·00 |
| අම්පාර .. | 4·24 | 61·75 | 54·24 | — | — | — | — | — | 45·75 | ·21 | — | 38·02 |
| ත්‍රිකුණාමලය .. | 45·62 | 52·45 | 45·62 | 2·83 | — | — | — | — | 54·37 | — | — | 47·54 |
| කුරුණෑගල .. | 24·38 | 25·42 | 24·35 | 7·10 | ·03 | — | ·62 | — | 72·02 | — | 2·96 | 74·57 |
| පුත්තලම .. | 38·15 | 9·37 | 38·15 | 3·12 | — | — | ·29 | — | 55·43 | — | 6·11 | 90·62 |
| අනුරාධපුරය .. | 18·83 | 43·46 | 18·83 | 27·45 | — | — | — | — | 79·84 | 33·98 | 1·32 | 22·54 |
| පොළොන්නරුව | 35·82 | 76·19 | 85·82 | 35 | — | — | — | — | 14·17 | — | — | 23 80 |
| බදුල්ල .. | 73·53 | 84·11 | 73·53 | 2·17 | ·13 | — | — | — | 24·84 | — | 1·61 | 15·88 |
| මොනරාගල .. | 58·47 | 84·84 | 58 47 | — | — | — | ·36 | — | 41·16 | — | — | 15·15 |
| රත්නපුරය .. | 57·49 | 44·56 | 67·49 | 10·51 | — | — | — | — | 32·22 | — | ·28 | 55·43 |
| කෑගල්ල .. | 91·17 | 39·66 | 91·17 | 25·13 | — | — | — | — | 8·82 | — | — | 60·33 |
| මුළු ගණන .. | 47·83 | 51·99 | 47·81 | 6·22 | ·01 | — | 1·06 | — | 49·30 | 7·44 | 1·64 | 40·56 |

මූලය: ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව, මහජන බැංකුවේ.

මාතර, කුරුණෑගල, බදුල්ල, රත්නපුරය යන දිස්ත්‍රික්ක හැර අන් සෑම දිස්ත්‍රික්කයකම 1969/70 මහ කන්නයේදී ප්‍රයෝජනයට ගන්නා ලද ණය ප්‍රමාණය පසුගිය මහ කන්නයට වඩා අඩුය. විශේෂයෙන් හම්බන්තොට, මඩකලපුව, අම්පාර හා අනුරාධපුරය යන දිස්ත්‍රික්කයන්හි ප්‍රයෝජනයට ගත් ණය ප්‍රමාණයේ තියුණු අඩුවීමක් දක්නට ලැබුණි. මෙම දිස්ත්‍රික්ක වලින් මඩකලපුව, අම්පාර හා අනුරාධපුරයෙහි සිය කැමැත්තෙන් ආපසු ගෙවුණු ප්‍රමාණයන් පසුගිය මහ කන්නයට වඩා පහත් වූ අතර, දිස්ත්‍රික්ක හතරේම එම ආපසු ගෙවීම් පසුගිය යලට වඩා අඩුවිය. පසුගිය මහ කන්නයේ අඩුම ආපසු ගෙවුම් මට්ටම අනුරාධපුරය දිස්ත්‍රික්කයේ ඇතිවූ අතර, එය දෙනු ලැබූ ණය ප්‍රමාණයෙන් සියයට 16·69 ක් පමණි.

දිස්ත්‍රික්ක ගණනාවකම 1969/70 මහ කන්නයේදී සිය කැමැත්තෙන් ආපසු ගෙවූ මට්ටම පසුගිය මහකන්නයට වඩා අඩුවිය. පසුගිය කන්නයේදී සිය කැමැත්තෙන් ආපසු ගෙවීම් උසස් මට්ටමකින් තිබූ මහනුවර, මාතර, පොළොන්නරුව, මොණරාගල හා කෑගල්ල වැනි දිස්ත්‍රික්කවල පවා ආපසු ගෙවීම් පහත වැටුණු අතර, ඇතැම් දිස්ත්‍රික්කවල මෙම පහත වැටීම් පැහැදිළිව පෙනුණි. මාතර දිස්ත්‍රික්කයේ 1968/69 මහ කන්නය සඳහා දෙනු ලැබූ ණයෙන් සියයට 91.95 ක් ආපසු ගෙවා තිබුණු අතර, එය (1969/70 මහ කන්නයේදී) සියයට 59·43 දක්වා පහත වැටුණි. මොණරාගල දිස්ත්‍රික්කයේ ද, සියයට 77.29 සිට සියයට 58.47 දක්වා පහත වැටුණි.

### (ii) අතිරේක භෝග-සමස්ථ තත්ත්වය

අතිරේක භෝග වගාව සඳහා දෙනු ලැබූ ණය ප්‍රමාණය 1968 ඔක්තෝබර් සිට 1969 සැප්තැම්බර් අතර කාලයේදී රුපියල් දශලක්ෂ 6·4 සිට 1969 ඔක්තෝබර් සිට 1970 සැප්තැම්බර් අතර කාලයේදී රුපියල් දශලක්ෂ 7·3 දක්වා වැඩිවිය. එහෙත් 1969/70 වර්‍ෂයේදී ආපසු ගෙවුම් මට්ටම් පසුගිය වර්‍ෂයට වඩා අඩුවී ඇති බව II (ඉ) 8 හා II (ඉ) 9 වැනි සංඛ්‍යා සටහන්හි දක්වා ඇති පරිදි වේ.

අතිරේක භෝග සඳහා දුන් මුළු ණයෙන් වැඩි කොටසක් සිරිත් පරිදි මිරිස්, රතුළූණු හා අර්තාපල් සඳහා මෙදත් වෙන්වීය. එළවළු නිෂ්පාදනය සඳහා දෙන ලද ණය ප්‍රමාණය පසුගිය වර්‍ෂයට වඩා අඩුවූ අතර, මිරිස්, රතුළූණු සහ අල සඳහා වර්‍ෂය තුල දෙනු ලැබූ ණය ප්‍රමාණ පසුගිය වර්‍ෂයට වඩා වැඩිවිය. එලවළු නිෂ්පාදනය සඳහා දෙනු ලැබූ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 0·1 කින් අඩුවූ අතර රතුළූණු, මිරිස් සහ අර්තාපල් සඳහා දෙන ලද ණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 0·5, රුපියල් දශ ලක්ෂ 0·3 හා රුපියල් දශ ලක්ෂ 0·2 යන ප්‍රමාණයන්ගෙන් වැඩිවිය.

වැඩිම ප්‍රමාණයක් ආපසු අයකර ගත හැකි වූයේ අර්තාපල් සඳහා දෙනලද ණය වලිනි. මෙය දෙන ලද ණය ප්‍රමාණයෙන් සියයට 72.38 ක් විය. ආපසු ලබාගැනීම් අඩුම මට්ටමක වූයේ රටකජු සහ ඉරිඟු සඳහා දුන් ණය සම්බන්ධයෙනි. මෙය සියයට 16.38 කි.

### දිස්ත්‍රික්ක අනුව තත්ත්වය

අතිරේක භෝග සඳහා දෙනු ලැබූ මුළු ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් යාපනය දිස්ත්‍රික්කය ප්‍රයෝජනයට ගැන්ම තව දුරටත් කෙරුණි. 1967/68 දී සියයට 49·4 සිට 1968/69 හි දී සියයට 58.8 දක්වාද, 1969/70 දී සියයට 66.1 දක්වාද යාපනය දිස්ත්‍රික්කය ප්‍රයෝනයට ගත් මුළු ණයෙහි අනුපාතය වැඩිවෙමින් පැවතුණි. පසුගිය වසරේ මෙන්ම 1969/70 දී ද යාපනය දිස්ත්‍රික්කය තුළ දෙන ලද මුළු ණයෙන් සියයට 90.0 ක් පමණම මිරිස් හා රතුළූණු සඳහා විය. අතිරේක භෝග සඳහා දුන් මුළු ණය ප්‍රමාණයෙන් බදුල්ල දිස්ත්‍රික්ය ප්‍රයෝජනයට ගත් ප්‍රමාණය 1968/69 දී සියයට 15.1 ක් වූ අතර, මේ වසරේදී එය සියයට 11.3 දක්වා පහත වැටුනේ වී නමුදු, අතිරේක භෝග සඳහා දෙනු ලැබූ මුළු ණයෙන් දෙවැනි වැඩි කොටස ලබාගත්තේ ද එම දිස්ත්‍රික්කයය. පසුගිය වසරේ මෙන් මෙම වසරේ දී ද බදුල්ල දිස්ත්‍රික්කය සියයට 89.0 ක් තරම් වන ප්‍රමාණයක් අර්තාපල් වගාව සඳහා උපයෝගී කොට ගෙන තිබුණි.

යාපනය දිස්ත්‍රික්කයේ ණය අයකර ගැනීම 1968/69 සියයට 89·3 ක් වූ අතර මෙම වසරේදී එය සියයට 65·2 දක්වා අඩුවිය. බදුල්ල දිස්ත්‍රික්කයේ ණය අයකර ගැනීම් 1968/69 වර්‍ෂයේ වූ සියයට 90·0 හා සසඳන කල එය මෙම වර්‍ෂයේ දී සියයට 48·0 ක් පමණ විය.

### (ඇ) ග්‍රාමීය ණය සහ ණය ගැතිකම පිළිබඳ සමීක්‍ෂණය

1970 වාර්ෂික වාර්තාවේ සඳහන් කළාක් මෙන් ග්‍රාමීය ණය සහ ණය ගැතිකම පිළිබඳ සමීක්ෂණයේ ක්‍ෂෙත්‍ර කටයුතු 1969 දෙසැම්බර් මාසයේදී නිම කෙරුණි. සමීක්ෂණයේදී රැස්කරගත් දත්ත දැනට සකස්වෙමින් පවතී.

## II (ඉ) 8 වැනි සංඛ්‍යා සටහන

## 1968/69 වර්ෂයන්හි අතිරේක බෝග සඳහා දෙන ලද ණය — දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය

ප්‍රමාණය රුපියල් දහස් ගණනින්

| දිස්ත්‍රික්කය | මිරිස් | | රතුළූණු | | අර්තාපල් | | එළවළු | | ආපසු අය කර ගත් ප්‍රමාණයෙහි ප්‍රතිශතය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ණයට දෙන ලද | අයකර ගන්නා ලද | ණයට දෙන ලද | අයකර ගන්නා ලද | ණයට දෙන ලද | අයකර ගන්නා ලද | ණයට දෙන ලද | අයකර ගන්නා ලද | මිරිස් | රතුළූණු | අර්තාපල් | එළවළු |
| කොළඹ .. .. | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| කළුතර .. .. | — | — | — | — | — | — | 210 | 210 | — | — | — | 100·00 |
| මහනුවර .. .. | — | — | — | — | — | — | 962 | 877 | — | — | — | 91·16 |
| මාතලේ .. .. | 153 | 46 | — | — | — | — | — | — | 30·06 | — | — | — |
| නුවරඑළිය .. .. | — | — | — | — | 3527 | 1670 | 1113 | 958 | — | — | 47·34 | 86·07 |
| ගාල්ල .. .. | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| මාතර .. .. | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| හම්බන්තොට .. .. | 1705 | 727 | 224 | 149 | — | — | — | — | 42·63 | 66·51 | — | — |
| යාපනය .. .. | 12704 | 9102 | 21,815 | 21,372 | 3411 | 3409 | — | — | 71·64 | 97·96 | 99·94 | — |
| | | | | | 50* | 50* | | | | | 100·00* | |
| මන්නාරම .. .. | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| වව්නියාව .. .. | 1993 | 337 | — | — | — | — | — | — | 16·90 | — | — | — |
| මඩකලපුව .. .. | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| අම්පාර .. .. | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| ත්‍රිකුණාමලය .. .. | 246 | 139 | 1461 | 1023 | — | — | — | — | 56·50 | 70·02 | — | — |
| කුරුණෑගල .. .. | 127 | 9 | 148 | 133 | — | — | — | — | 7·08 | 89·86 | — | — |
| පුත්තලම .. .. | 554 | 185 | 2 | 2 | — | — | — | — | 33·39 | 100·00 | — | — |
| අනුරාධපුරය .. .. | 1682 | 177 | — | — | — | — | — | — | 10·52 | — | — | — |
| පොලොන්නරුව .. | 223 | 215 | 140 | 140 | — | — | — | — | 96·41 | 100·00 | — | — |
| බදුල්ල .. .. | 4 | 4 | 7 | 7 | 8083 | 7264 | 1636 | 1479 | 100·00 | 100·00 | 89·86 | 90·40 |
| මොණරාගල .. .. | 454 | 434 | 261 | 261 | — | — | — | — | 95·59 | 100·00 | — | — |
| රත්නපුරය .. .. | 569 | 455 | 646 | 465 | — | — | 427 | 271 | 79·96 | 71·98 | — | 63·46 |
| කෑගල්ල .. .. | — | — | — | — | — | — | — | — | — | — | — | — |
| මුළු ගණන .. | 20,414 | 11,830 | 24,704 | 23,552 | 15,021 | 12,343 | 4348 | 3795 | 57·95 | 95·33 | 82·17 | 87·28 |
| | | | | | 50* | 50* | | | | | 100·00* | |

* බොම්බයි ළූණු

මූලය: ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව, මහජන බැංකුව.

## II (ඉ) 9 වැනි සංඛ්‍යා සටහන

## 1969/70 වර්ෂයන්හි අතිරේක බෝග සඳහා දෙන ලද ණය—දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය

ප්‍රමාණය රුපියල් දහස් ගණනින්

| දිස්ත්‍රික්කය | මිරිස් | | රතුළූණු | | අර්තාපල් | | එළවළු | | රටකජු හා ඉරිඟු | | ආපසු අය කර ගත් ප්‍රමාණයෙහි ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ණයට දෙන ලද | අයකර ගන්නා ලද | ණයට දෙන ලද | අයකර ගන්නා ලද | ණයට දෙන ලද | අයකර ගන්නා ලද | ණයට දෙන ලද | අයකර ගන්නා ලද | ණයට දෙන ලද | අයකර ගන්නා ලද | මිරිස් | රතුළූණු | අර්තාපල් | එළවළු | රටකජු හා ඉරිඟු |
| කොළඹ .. | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| කළුතර .. | – | – | – | – | – | – | 155 | 155 | – | – | – | – | – | 100·00 | – |
| නුවර .. | – | – | – | – | 82 | 68 | 950 | 767 | – | – | – | – | 82·92 | 80·73 | – |
| මාතලේ .. | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| නුවරඑළිය .. | – | – | – | – | 2827 | 2041 | 773 | 509 | – | – | – | – | 72·19 | 65·84 | – |
| ගාල්ල .. | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| මාතර .. | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| හම්බන්තොට .. | 893 | 63 | 134 | 38 | – | – | – | – | – | – | 7·05 | 28·35 | – | – | – |
| යාපනය .. | 15651 | 8270 | 26125 | 16920 | 6654 | 6409 | – | – | – | – | 52·84 | 64·76 | 96·31 | – | – |
| මන්නාරම .. | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| වවුනියාව .. | 600 | 2 | – | – | – | – | – | – | – | – | ·33 | – | – | – | – |
| මඩකලපුව .. | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| අම්පාර .. | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| ත්‍රිකුණාමලය .. | 269 | 67 | 2198 | 774 | – | – | – | – | – | – | 24·90 | 35·21 | – | – | – |
| කුරුණෑගල .. | 479 | 107 | 122 | 71 | – | – | – | – | – | – | 22·33 | 58·19 | – | – | – |
| පුත්තලම .. | 1289 | 302 | – | – | – | – | – | – | – | – | 23·42 | – | – | – | – |
| අනුරාධපුරය .. | 2982 | 351 | – | – | – | – | – | – | – | – | 11·77 | – | – | – | – |
| පොළොන්නරුව .. | 112 | 89 | – | – | – | – | – | – | – | – | 79 46 | – | – | – | – |
| බදුල්ල .. | – | – | – | – | 7275 | 3671 | 935 | 312 | 15 | 6 | – | – | 50·46 | 33·36 | 40·00 |
| මොණරාගල .. | 1100 | 541 | 410 | 211 | – | – | – | – | 34 | 2 | 49·18 | 51·46 | – | – | 5·88 |
| රත්නපුරය .. | 559 | 321 | 608 | 179 | – | – | – | – | – | – | 57·42 | 29·44 | – | – | – |
| කෑගල්ල .. | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – | – |
| මුළු ගණන .. | 23934 | 10113 | 29597 | 18193 | 16838 | 12189 | 2813 | 1743 | 49 | 8 | 42·25 | 61·46 | 72·38 | 61·96 | 16·38 |

මූලය: ග්‍රාමීය ණය දෙපාර්තමේන්තුව,
මහජන බැංකුව.